වැඩකරන්න එතන පුළුවන් වුණා. හැත්තෑහයේ අගෝස්තු වෙනකම් ආකාශ්වානියේ තමයි වැඩකළේ.

**ඒ කාලේ අමතක නොවෙන සිදුවීමක් මතක් කළොත්... ?**

හැට හතේ වෙසක් පෝය දවසේ උදේ බුද්ධගයා බෝධි මූලයේ ඉදලා පැය භාගයක් සජීවී වැඩසටහනක් ඉදිරිපත් කරන්න කියලා ශ්‍රී ලංකා ගුවන් විදුලියෙන් ලැබුණු ආරාධනාවක් නිසා පෝයදාට කලින් දා මම බුද්ධ ගයාවට ආවා. ශ්‍රී මහ බෝධි මූලයේ වෙසක් පෝයදා අටසිල් ගන්න ආශාවක් ඇතිවෙලා මගේ බිරියත් මේ ගමනට එකතු වුණා. සාමාන්‍යයෙන් බුද්ධගයා වන්දනාවට මිනිස්සු යන්නේ ඔක්තෝබර් මුල් සතියේ ඉදලා මාර්තු වෙනකම් විතරයි. අප්‍රේල් මැයි කාලේ බුද්ධගයාවේ උෂ්ණත්වය අංශක 40කට වැඩියි. මේක මිනිස්සුන්ට ඔරොත්තු දෙන්නේ නැති නිසා වන්දනාකරුවෝ තියා වෙනත් කෙනෙක්වත් එහෙ යන්නේ නෑ. එහෙ ඉන්නේ විහාර වල පදිංචි වෙලා ඉන්න ඉතාම සුළු පිරිසක් විතරයි. කොයිතරම් අපහසුවෙන් වුණත් මගේ බිරිය එදා වෙසක් පෝව දවසක මහාබෝධී මූලයේ සිල් සමාදන් වුණ ප්‍රථම සිංහල කාන්තාව විදිහට ඉතිහාසයටත් එකතු වුණා මට මතක විදිහට.

**ඔබ කාලයක් ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනගේ මාධ්‍ය ලේකම් විදිහටත් වැඩකරල තියනවා. ඔබ දැකපු ජේ ආර් මොන වගේ කෙනෙක්ද ?**

ඔය මාධ්‍ය ලේකම් කම මම ඒ තරම් කැමැත්තෙන් බාරගත්ත දෙයක් නෙවෙයි. බෑ කියන්ඩ බැරි කමට බාරගත්තේ. ජේ. ආර්. කාලෙන් කාලෙට වෙනස් ගති පෙන්නුම් කළ කෙනෙක්. තරුණ කාලේ නීති ශිෂ්‍යයෙක් වෙලා හිටපු කාලේ වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී හිටපු ජේ.ආර්. බලයට පත්වුණාට පස්සේ ඒකට විරුද්ධ කෙනෙක් වුණා. 1928 කම්කරු ව්‍යාපාරයේ මුල් අවධියේ ඇති වුණ විශාලම වැඩ වර්ජණය කොළඹ ට්‍රෑම් කාර් වැඩවර්ජනය. ඒ කාලේ තාත්තගේ කාර්

*ජේ.ආර්. හැමවෙලාවෙම කල්පනා කළේ ඊළඟ මැතිවරණය දිනන හැටි ගැන. ඔහුගේ දෙවැනි ධූර කාලය රටට විශාල හානියක් සිද්ධවුණ කාලයක්. දෙවැනි ධූර කාලය අවසන් කළේ ස්ත්‍රී දූෂණ චෝදනාවකට හිරේ හිටපු දේශපාලන මැරයෙකු නිදහස් දිනයේ විශේෂ සමාවක් දීලා නිදහස් කරලයි.*

එක අරගෙන ගිහිල්ලා වර්ජකයන්ට සහාය දක්වපු ජේ.ආර්. අසූවේ වර්ජණය බරපතල විදිහට මර්ධනය කළා. පහු කාලයේ දේශපාලන තීරණ ගැනීමේදී මුලදි තිබුණ ශක්තිය නැතුව ගිහින් අනෙක් අයගේ කීමට නැවෙන කෙනෙක් වුණා. 82 ජනමත විචාරණයක් පවත්වන්න යෝජනා වුණ වෙලාවේ ලලිත් ඇතුළත්මුදලි, ගාමිණී දිසානායක තදින්ම විරුද්ධ වුණත් ප්‍රේමදාසගේ උවමනාව උඩ ඒක කරන්න ජේ.ආර්. තීරණය කළා. ජේ.ආර්. හැමවෙලාවෙම කල්පනා කළේ ඊළඟ මැතිවරණය දිනන හැටි ගැන. ඔහුගේ දෙවැනි ධූර කාලය රටට විශාල හානියක් සිද්ධවුණ කාලයක්. අසූතුනේ පෙබරවාරි 04 වෙනිදා දෙවැනි ධූර කාලය ආරම්භ වෙලා හය මාසයක් යන්න කලින් කලු ජූලිය ඇතිවුණා. දෙවැනි ධූර කාලය අවසන් කළේ ස්ත්‍රී දූෂණ චෝදනාවකට හිරේ හිටපු දේශපාලන මැරයෙකු නිදහස් දිනයේ විශේෂ සමාවක් දීලා නිදහස් කරලයි. ඔය වගේ දුර්වලතා ගොඩක් තිබුණා. හැබැයි සමහර කාරණා සම්බන්ධයෙන් ජේ.ආර්. ගැන මිනිස්සුන්ට තියෙන්නෙ වැරදි වැටහීමක්. ජේ.ආර්. ඉන්දියන් විරෝධියෙක් කියන කතාව ඒ අතර එකක්. ජේ.ආර්.ගේ තිබුණ ඉන්දියන් විරෝධයක් නෑ. එයාට තිබුණේ ගාන්ධි විරෝධයක්. හේතුව ගාන්ධි පවුලයි බණ්ඩාරනායක පවුලයි අතරේ තියන හිතවත්කම. හැත්තෑහතේ බලයට ආවට පස්සේ තිබුණ පළවෙනි නිදහස් උත්සවේ ප්‍රධාන අමුත්තා විදිහට ජේ.ආර්. ගෙන්නුවේ ඉන්දියාවේ අගමැති මොරාජි දේසායිව. ඉන්දිරා ගාන්ධි අගමැති වුණාට පස්සේ තමයි තත්ත්වය වෙනස් වෙන්නේ.

**මේ වගේ දේවල් නිසා කළකිරීමෙන් ඔබ මාධ්‍ය ලේකම් කමෙන් ඉවත්වුණාද ?**

නෑ. ඔය අතරේ තමයි ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් තනතුරේ පුරප්පාඩුවක් ඇතිවෙන්නේ. ඒ ගැන දැනගත්ත වෙලාවේ මම කිව්වා ඒකට යන්න කැමතියි කියලා. කාලයක් තිස්සේ ඉන්දියාවේ හිටිය නිසා මට ඒකට කැමැත්තක් ඇතිවුණා. මම ගියාට පස්සේ වෙන කෙනෙක් මාධ්‍ය ලේකම්වරයෙක් විදිහට පත්කරගත්තෙත් නෑ. ජේ. ආර්.ගේ මාධ්‍ය ලේකම් තනතුර එතනින් ඉවර වුණා. ඊට පස්සේ ඒ කටයුතු කෙරුණේ ප්‍රවෘත්ති දෙපාර්ථමේන්තුවේ මාධ්‍ය නිලධාරින් අතින්. මගෙන් පස්සේ වෙනත් මාධ්‍ය ලේකම් කෙනෙක් පත්කරගෙන තිබුණේ නෑ.

**දීර්ඝ කාලයක් රටේ දේශපාලනයත් එක්ක සමීප ගනුදෙනුවක යෙදුණ ඔබ අද රටේ පවතින තත්ත්වය දකින්නේ කොයි විදිහටද ?**

අද රටට අලුත් කාලපරිච්ඡේදයක් උදාවෙලා තියනවා. මම ඒක දකින්නේ වාමාංශික සමගියේ ප්‍රබෝධමත්ම අවදිය විදිහට. හරියට වැඩ කළොත් රටට හොද අනාගතයක් උදාකළ හැකියි. දෙවැනි ලෝක යුද්ධය එනකොට අපි බොහොම ඉහළ තත්ත්වයක හිටිය රටක්. ක්‍රමයෙන් අපි රටක් විදිහට පිරිහුණා. යටත් විජිත කාලයේ තමයි ගමයි පන්සලයි අතර හොද සම්බන්ධයක් තිබුණේ. නිදහසින් පස්සේ ඒක බිද වැටුණා. භික්ෂුවත් පිරිහුණා. ථේරවාදී බෞද්ධ රටවල් අතරින් රැකියා කරන හාමුදුරුවරු ඉන්න එකම රට ලංකාව. වෙන කොහේවත් නෑ. රැකියා විතරක් නෙවෙයි දැන් දේශපාලනෙත් කරනවා. පාර්ලිමේන්තුවටත් යනවා. කන්නන්ගර මහත්තයා ගෙනාව නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තියත් නිදහසින් පස්සේ දිගින් දිගටම පිරිහුණා මිස වැඩි දියුණුවක් වුණේ නෑ. හැටහයේ ඉන්දීය රුපියල අපේ රුපියලට වඩා වටිනාකමින් අඩුයි. අපේ ශත 89 ක් තමයි ඉන්දීය රුපියලක් වුණේ. අද ඉන්දීය රුපියල අපේ රුපියල් දෙකයි පනහක් වෙලා. සෞඛ්‍ය සේවය, තැපෑල, ප්‍රවාහනය වගේ කොයි අතින් ගත්තත් අද තියෙන්නේ යටත් විජිත කාලෙට වැඩිය පිරිහීමක්. අපි රටක් විදිහට ලබපු හැම ජයක්ම ලබල තියෙන්නේ නිදහසට කලිනුයි. ඉතිං රට ආශ්චර්යයක් කරන්න නම් ඊට කලින් මෙන්න මේ පිරිහීම වළක්වලා නිදහස ලබද්දි රට තිබුණ තැනටවත් නැවත ගොඩනගන්න ඕනේ.

**ඔබේ දරු පවුල සහ අනාගත බලාපොරොත්තු ගැන යමක් සඳහන් කළොත්...?**

මම ප්‍රේම සම්බන්ධයකින් අඩු වයසින්ම විවාහ වුණා. බිරිය සෝමා කරුණාතිලක. අපිට දරුවෝ පස්දෙනෙක් ලැබුණා. ලොකු පුතා තරුණ කාලෙදිම හෘදයාබාධයකින් නැතිවුණා. දෙවැනියා සුගීස්වර පී සේනාධීර කාලයක් තිස්සේ විවිධ ජනමාධ්‍යවල කටයුතු කරලා දැන් ඉන්දියාවේ නියෝජ්‍ය මහ කොමසාරිස් විදිහට වැඩ කරනවා. තුන්වෙනි පුතා රුවන් ඕස්ට්‍රේලියාවේ පදිංචිවෙලා ඉන්නවා. ඊලග පුතා ගෝමි සේනාධීර වෙළද දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්. අන්තිමයා මුදිතා දුවත් දැන් ඕස්ට්‍රේලියාවේ පදිංචිවෙලා එහෙ ආණ්ඩුවේ ගුවන් විදුලියේ වැඩසටහන් නිෂ්පාදිකාවක් විදිහට රස්සාව කරනවා. අනාගතය ගැන ලොකු බලාපොරොත්තු කිසිම දෙයක් මට නෑ. දැන් මම ඉන්න අසනීප තත්ත්වය නිසා මගේ ආයුෂ තව අවුරුද්දකට හරි දෙකකට හරි වැඩි නෑ කියන එක වෛද්‍යවරු කියලා තියනවා.




Mathematics/ Science.
Year 7 -10
$20 per hour.
**Current Uni Student in Maths and Science.**
Tel: 0433 737 584
or 9701 3241

ADVERTISING
Please call
Asoka
on
0425 720 932